# උපෝසථකර්මය හා භික්ෂු පාරිශුද්ධිය

ශාස්ත්‍රවේදී පණ්ඩිත බුද්ධ ශ්‍රාවක ධර්ම පීඨයේ කථිකාචාර්ය
කබලෑවේ පූජ්‍ය සියභාරති ස්ථවිර

'උපොසථ' යනු 'උපවසථ' යන්නෙහි ව්‍යාජත වචනයකි. උපවසථ යන්න වෛදික යුගයේ සිට ඉන්දු ආර්යයන් අතර පැවත එන ආගමික චාරිත්‍රයකි. අමාවක හා පුරපසළොස්වක නිමිති කොට පැවැත් වෙන දර්ශ හා පෞර්ණමී යන අර්ධ මාසික යාගයන් වෙනුවෙන් යජමානයා - යාගකාරකයා සූදනම් වන්නේ උපවසථ දිනයන්හි දී ය. එකළහ දින දෙකක මෙම පූජාවන් පැවැත්වීම සාමාන්‍ය චාරිත්‍ර වන අතර එයින් පළමු දිනය උපවසථ දිනය ලෙස ගැනේ. ශුද්ධ ගින්න දල්වන ස්ථානය ඇමද පවිත්‍ර කිරීම යජමානයා හා ඔහුගේ බිරිඳ ව්‍රත සමාදනය ආදිය කොට සූදනම් වීම මෙදින කෙරෙන කටයුතුය. දෙවන දිනයෙහි ප්‍රධාන යාග කටයුතු සඳහා ව්‍යාවෘත වේ. මෙම යාගය පවත්වන දිනය පිළිබඳව මත භෙද පැවතුනත් බොහෝ ආගමික නීති දයකයන්ගේ මතය වන්නේ පක්ෂයෙහි මුල්දින හෙවත් මාසයෙහි මුල්දින (පුරපෑළ විය) හා සොළොස්වන දින (අවපෑල විය) ප්‍රධාන යාග සඳහා නියමිත දින වන බවයි. එවිට අමාවක හා පුරපසළොස්වක 'උපවසථ' දින වෙයි.

උපවසථ යන වචනයෙහි දෙවියන් සමීපයෙහි වාසය කිරීම යන අරුත ලැබේ. උපවසථ දිනයන්හිදි දෙවියන් යජමානයා සමග වාසය කිරීමට පැමිණෙතැයි වෛදිකයෝ විශ්වාස කළහ.* ඒ නිසා එම දිනයෙහි ව්‍රත සමාදනාදියෙන් යජමානයාගේ පාරිශුද්ධියක් ඇතිවන්නේ යැයි සලකා ඇත. මෙම දිනයෙහි යජමානයා උපවාසයෙන් හෝ අර්ධ උපවාසයෙන් යුක්තව අගන්‍යාගාරයට පිවිස වසන බව ශතපත බ්‍රාහ්මණයෙහි සඳහන් වේ. උපනිෂද් වල එන පරිදි මෙදින යජමානයා ව්‍රත දින චාරිත්‍ර සම්පූර්ණ කළයුතු අතර බ්‍රාහ්මණ සන්‍යාසින් විසින් ආරණ්‍යක හෝ උපනිෂද් ගායනය කළ යුතුය.[1]

මෙසේ උපවසථය බ්‍රාහ්මණ ආගමික සංස්කෘති යෙහි යාගය හා සම්බන්ධව පැවතුන ක්‍රියාවලියකි. මේ නිසා උපවසථ දිනයන්හි ඇති ආගමික හා සංස්කෘතික වැදගත්කම බෞද්ධ - ජෛන ආදී අන්‍ය ආගමිකයන් විසින් වුවද බැහැර කළ හැකි දෙයක් නොවීය. එනිසා යාගවිධි ප්‍රතික්ෂේප කළ බෞද්ධයන් අතරද උපවසථ දිනයන්හිදී ඔවුන්ගේ ආගමට අනුකූල චාරිත්‍ර විධි ඇතිවිය.* බ්‍රාහ්මණ යජමානයා මෙන්ම ජෛන ගෘහස්ථයාද උපවසථ දිනයෙහි තාවකාලිකව ගෘහ ජීවිතයෙන් ඈත්ව ව්‍රත සමාදන ආදියෙහි යෙදේ.

බුදු සමය පහළ වන විට උපෝසථ ශබ්දයෙන් චන්ද්‍ර මාසයේ 1, 8, 15, 23 යන දින කියැවිනි. මේ අයුරින් සතිපතා ශුද්ධ දිනයක් බැගින් නියම විය. බුදුරජාණන් වහන්සේද භාරතීය සමාජයේ මුල් බැස ගෙන තිබූ සාධු සම්මත සංස්කෘතික අංගයන් ප්‍රතික්ෂේප නොකළහ. එනිසා උපොසථ දිනයෙහිදී බෞද්ධ ගෘහස්ථයට අෂ්ඨාංග ශීල සමාදනයද භික්ෂු භික්ෂුණීන්ට ප්‍රාතිමොක්ෂය උදෙසීමද අනුදන වදළහ.[2] බෞද්ධ අෂ්ඨාංග ශීල සමාදනය වෛදික ව්‍රත සමාදනයට සම්පූර්ණයෙන් සමාන නොවන නමුදු එයද 'ගහට්ඨවත්ත' නමින් සුත්ත නිපාතයෙහි සඳහන් වේ.[3] මජ්ඣිම නිකායේ භය භේරව සූත්‍රයේ පක්ෂයාගේ චාතුද්දසි — පඤ්චදසි අට්ඨමී දිනයන්හී උපොස්ථ සමාදනය අනුදන ඇත.[4] පැරණි ලංකාවේ උපොසථ දිනය ගතකළ ආහාරය පිළිබඳව ලැබෙන ඓතිහාසික සාධක අනුව උපොස්ථය ආගමික හා සංස්කෘතික වැදගත්කමක් ඇති සංස්ථා වක් බවට පත් වූ අයුරු පෙනේ.

බුදුසමයේ ගිහි බෞද්ධයා සඳහා වූ උපොස්ථය ව්‍රත සමාදනාදියක් නොව පුද්ගලයාගේ බාහිර—අභ්‍යන්තර පාරිශුද්ධිය හා චිත්ත සමාධිය පදනම් කරගෙන සකස් වූ ක්‍රියාවලියකි.

අංගුත්තර නිකායේ තික නිපාතයේ උපෝසථ සූත්‍රයේ උපෝසථ 3 ක් දක්වේ.[5]

1. ගොපාල උපෝසථය
2. නිගණ්ඨ ,,
3. අරිය ,,

(125 දේවමිත්තා සංශෝධනය)

යනුයි. එහි අරිය උපෝසථ නම් වූ බෞද්ධ ගෘහස්ථයා සඳහා වූ උපෝසථයෙහි විශේෂ ලක්ෂණ මැනවින් පැහැදිලි කර තිබේ. චිත්ත පාරිශුද්ධියට උපයෝගි වන කර්මස්ථානයක් වශයෙන්ද හැඳින්විය හැකි අරිය උපෝසථයෙන් පුද්ගල අධ්‍යාත්මය ක්‍රම ක්‍රමයෙන් පවිත්‍ර කෙරේ.

මෙහිදී බුද්ධ ශ්‍රාවකයා බුද්ධ, ධම්ම, සංඝ යන තෙරුවන් ගුණ සමරන විට ඇතිවන චිත්ත ප්‍රසාදය හේතුකොට ගෙන ඇතිවන චිත්ත පාරිශුද්ධිය බ්‍රහ්මූපෝසථ, ධම්මූපෝසථ, සංඝූපෝසථ යන නම් වලින් හැඳින් වේ. තමාගේ ශීල ගුණය ගැන සිහි කරන විට ඇතිවන චිත්ත ප්‍රසාදය හේතුකොට සිදුවන

චිත්තෝපක්ලේශයන්ගේ දුරුවීම ශීලූපෝසථ නමින් දක්වේ. දෙවියන්ට බඳු ශ්‍රද්ධා, ශීල, ශ්‍රැත, ත්‍යාග හා ප්‍රඥ යන ගුණයන් තමන්ටද ඇතැයි හිතන විට චිත්ත ප්‍රසාදය ඇතිවී සිදුවන චිත්තොපක්ලේශ ප්‍රහාණය දේවතුපෝසථ නමින් දක්වේ.

බෞද්ධ ගෘහස්ථයා අෂ්ඨාංග ශීල සමාදනයෙන් උත්සාහ කරන්නේ තාවකාලිකව හෝ ආර්ය පුද්ගලයන් අනුකරණය කරන්නටය. "යම්සේ රහතන් වහන්සේ දිවිහිමියෙන් ප්‍රාණඝාත, අදත්තා දන ආදියෙන් තොරව වෙසෙත්ද මම ද අද දිවා රෑ එසේ වෙසෙමි. රහතුන් අනුකරණය කරමි. එයින් මාගේ උපෝසථය සම්පූර්ණ වේ" යි සිතයි. මෙසේ බෞද්ධ උපෝසථය පුද්ගලයාගේ බාහිර අභ්‍යන්තර පාරිශුද්ධිය හා ශික්ෂණයද පදනම් කරගෙන පවතී.

බෞද්ධ භික්ෂූන්ගේ උපෝසථය පාති-මෝක්ඛුද්දේස නමින් විනය පිටකයෙහි හඳුන්වා ඇත. පක්ෂයෙහි තුදුස්වක දිනයක හෝ පසළොස්වක දිනයක (මසකට දෙවරක්) පැවැත්විය යුතු එය ව්‍රත පූරණයක් නොවේ. සංඝයා මධ්‍යයේ ප්‍රාතිමෝක්ෂ ශික්ෂා උදෙසා සීමාවෙහි රැස් වූ සංඝයාගේ පාරිශුද්ධිය හා සාමග්‍රිය සාමූහිකව පිහිටුවා ගැනීමේ විනය කර්මයක් ලෙස එය දැක්විය හැකිය. බෞද්ධ භික්ෂූන් සඳහා වූ උපෝසථ කර්මය කිරීම සඳහා දින, කාරක කර්තෘව්‍යාකාර, යන අංග සම්පූර්ණ විය යුතුය. ඒ අනුව උපෝසථ නවවිධ වේ.[6]

දින (දවස් වශයෙන්):– චාතුද්දසී උපෝසථය
පණ්ණරසී ,,
සාමග්ගී ,,

කාරක (සහභාගීවන භික්ෂූන් වශයෙන්):–
සංඝ උපෝසථය
ගණ ,,
පුග්ගල ,,

කර්තෘව්‍යාකාර (කරණ ආකාරය):–
සුත්තුද්දෙස උපෝසථය
පාරිසුද්ධි ,,
අධිට්ඨාන ,, යනුවෙනි.

චාතුද්දසී උපෝසථය:- තිථි තුදුසක් සම්පූර්ණවීමෙන් ගැණෙන පොහොය චාතුද්දසියයි. හේමන්ත - ගිම්හාන - වස්සාන යන ඍතු තුනෙන් එකිනෙක ඍතුවෙක තුන්වෙනි හා සත්වෙනි පොහොය චතුද්දසී උපෝසථය වේ.

පණ්ණරසී උපොසථය:- තිථි පසළොසක් සපිරීමෙන් ගැණෙන පොහොය පණ්ණරසියයි. ඉහත දක්වූ පරිදි සෑම ඍතුවකම තුන්වැනි, සත්වැනි පොහොය හැර අනෙක් සියල්ල පණ්ණරසී උපොසථය වෙයි.

සාමග්ගී උපොසථය;- මෙහිදී දින නියමයක් නොමැත. ධර්ම, විනය කරුණක් මත, භෙද වී සිටි සංඝයා සමගි වීමෙන් පසු කළයුතු උපොසථය සාමග්ගී උපොසථය නම්. සාමග්ගී උපොසථයක් නොමැතිව චාතුද්දසී-පණ්ණරසී උපොසථ වල මිස පක්ෂයෙහි වෙනත් කිසිම දිනක උපොස්ථ කර්මය කිරීම තහනම්ය.

i සංඝ උපොසථය:- සංඝ ව්‍යවහාරය යෙදෙන්නේ උපසපන් භික්ෂූන් සතර (4) නමකට හෝ වැඩි ගණනකටය. උපොසථ දිනයෙහි සීමාමාලකයට රැස්වන සතර නමක් හෝ වැඩි පිරිසක් විසින් කළයුතු උපොසථ කර්මය සංඝ උපොසථ නම්.

ii ගණ උපොසථය:- තෙනමක් විසින් කරනු ලබන පොහොය ගණ උපොසථය නම්.

iii පුග්ගල උපොසථය:- දෙනමක් හෝ එක නමක් විසින් කරනු ලබනුයේ පුග්ගල උපොසථ නම්.

i සුත්තුද්දේස උපොසථය:- සුත්තුද්දේශ යනු ප්‍රාතිමෝක්ෂ උද්දේශයයි. මෙය චාතුද්දසී - පණ්ණරසී හෝ සාමග්ගියෙහි උපොස්ථාගාරයට රැස්වන සතර නමක් හෝ වැඩි පිරිසක් විසින් කළ යුතුය.

ii පාරිසුද්ධි උපොසථය:- උපොසථාගාරයට සිව් නමක්වත් රැස්වී නොමැති නම් පාමොක් දෙසිය නො හැක. රැස්ව සිටින පිරිස දෙනමක් හෝ තෙනමක් නම් ඒ භික්ෂූන් සඳහා නියමිතව ඇත්තේ පාරිශුද්ධි උපොසථයයි. ඔවුනොවුන්ගේ පාරිශුද්ධිය ප්‍රකාශ කිරීම පාරිශුද්ධි උපොසථය වශයෙන් ගැනේ.

iii අධිට්ඨාන උපොසථය:- එක භික්ෂුවක් විසින් කළ හැකි උපොසථ කර්මයයි. පොහොය කළ යුතු දිනයෙහි ආවාසයෙහි සිටින්නේ එක නමක් නම් අද පොහෝ දිනය යැයි ඉටා ගත යුතුය. එය අධිට්ඨාන උපොසථය නම්.

මෙසේ උපොසථ කරණය එහි ගරුත්වය හා විශිෂ්ඨත්වය රැකෙනසේ ක්‍රමානුකූලවත් සංවිධානාත්මකවත් සැකසී ඇත. ඉහත සඳහන් අයුරු උපොසථ කර්මයන් කිරීම සඳහා ඒ උදෙසාම සංඝ සම්මුතියෙන් පිහිටවූ බද්ධ සීමාවක් හෝ උදකුක්ඛෙපාදිවූ ස්වාභාවික සීමාවක් හෝ විය යුතුය. එහිදී පුබ්බ කරණ - පුබ්බකිච්ච පත්තකල්ල ආදී අංග සම්පූර්ණවී තිබිය යුතුය.

මෙහිදී විශේෂයෙන් සුත්තුද්දේශ නමින් ගැනෙන සංඝ උපොස්ථ කර්මයකදී එහි රැස්වන සංඝයා ඉදිරිපිටදී පාතිමොක්ඛ නම් වූ භික්ෂූන් සඳහා වූ සියලු විනය ශික්ෂාවන් කොටස් වශයෙන් අනුශ්‍රාවණය කරනු ලැබේ. එම ශික්ෂා දේශනා කරන භික්ෂුව පළමු කොට මෙසේ කියයි. "පාතිමොක්ඛං උද්දිසිස්සාමි, තං සබ්බෙව සන්තා සාධුකං සුණොම, මනසිකරොම, යස්ස සියා ආපත්ති සො ආවිකරෙය්‍ය, අසන්තියා ආපත්තියා තුණ්හි භවිතබ්බං, තුණ්හි භාවෙන ඛො පනායස්මන්තෙ පරිසුද්ධාති වෙදිස්සාමි"[7]

(පාමොක් උදෙසන්නෙමි. ඒ පාමොක් අපි සැම දෙනාම මනා කොට අසමු. මෙනෙහි කරමු. යමෙකුට ඇවැත් වේ නම් හෙතෙම එය ප්‍රකට කරන්නේය. ඇවැත් නැති කල්හි නිශ්ශබ්ද විය යුතුය. නිශ්ශබ්දතාවය හේතු කොට ගෙන ආයුෂ්මතුන් පිරිසිදු යැයි දැන ගන්නෙමි.)

මෙසේ කියා එක් විනය ශික්ෂාපද කොටසක් සහමුළු ප්‍රකාශ කොට අවසන්හි මෙසේ අසයි.

"තත්ථා යස්මන්තෙ පුච්ඡාමි. කච්චිත්ථ පරිසුද්ධා, දුතියම්පි පුච්ඡාමි කච්චිත්ථ පරිසුද්ධා? තතියම්පි පුච්ඡාමි, කච්චිත්ථ පරිසුද්ධා?

පරිසුද්ධෙත්ථායස්මන්තො තස්මා තුණ්හි එවමෙතං ධාරයාමි.[8]

(එහිලා ඇවතුන් වචාරමි. කිම පිරිසිදුද? දෙවෙනි වරද විචාරමි. කිම පිරිසිදුද? තෙවෙනි වරද විචාරමි. කිම පිරිසිදුද? ආයුෂ්මත්හු පිරිසිදු වූවාහුය. එහෙයින් නිහඬ වෙයි. මෙසේ මෙය දරමි. (සලකමි.)

මෙසේ

1. නිදානුද්දේස
2. පාරාජිකුද්දේස
3. සංඝාදිසෙසුද්දේස
4. අනියතුද්දේස
5. විත්ථාරුද්දෙස[9] වශයෙන් පස් තැනෙක්හි

ප්‍රාප්ත සංඝයාගේ පිරිසිදු බැව් විමසත්. මෙය කිසිසේත් පව් සමාකිරීමක් නොවේ. ආයති සංවර යෙහි පිහිටුවීමකි. එනම් ප්‍රමාදයකින් වරක් සිදුකළ වරද නැවත නොකරන සේ සංවරයෙහි පිහිටුවීමයි. මෙසේ උපෝසථ කර්මය සංඝ සමාජයෙහි සමගි යටත්, පාරිශුද්ධියටත්, චිරජීවනයටත් විනය ගරුක භාවයටත් අතිශයින් ඉවහල්වන අයුරින් බුදු රජාණන් වහන්සේ යොදගත් සේක. බ්‍රාහ්මණ සංස්කෘතියේ ආගමික ක්‍රියා නිසා ව්‍යවහාරයට පත් උපෝසථ දිනය තීර්ථක ආදී අන්‍ය සමය වාදීන් ඔවුන් සමයාගම් ජනතාව අතර ප්‍රචලිත කිරීම සඳහා පමණක් යොද ගනිද්දී බුදුරජාණන් වහන්සේ බෞද්ධ සමයේත් එහි ආරක්ෂකයන් වූ සංඝ සමාජයේත් විශිෂ්ටත්වය කැපී පෙනෙන වඩාත් ප්‍රතිඵලදායි ක්‍රියා මාර්ගයකට යොමු කළහ.

---

සටහන්

* ශතපථ බ්‍රාහ්මණ 1 - 1 - 1 - 7
1. ආරණ්‍යාවි නිෂදය
* සිංහල විශ්ව කෝෂය (4 කාණ්ඩය ව පි. 733)
2. මහාවග්ග පාළි (බු. ජ. මු ) උපොසථ ඛන්ධකය - පි. 250
3. සුත්ත නිපාත
4. මහාවග්ග පාළි (බු.ජ.මු ) උපොසත ඛන්ධකය - චතනාරි උපොසථ කම්ම - පි. 270
5. අංගුත්තර නිකාය - තික නිපාතය - උපොසථ සුත්ත
6. මහාවග්ග පාළි (බු. ජ. මු.) උපොසථ ඛන්ධකය - ථ. 248
7. ප්‍රාතිමෝක්ෂ විවරණය (බු. ධම්මපරායන තිස්ස හිමි) 1971 ප්‍රථම මුද්‍රණය - 3 පිටුව
8. ප්‍රාතිමෝක්ෂ විවරණය (බු. ධම්මපරායන තිස්ස හිමි) 1971 ප්‍රථම මුද්‍රණය - 3 පිටුව
9. මහාවග්ග පාළි (බු. ජ. මු ) උපොසථ ඛන්ධකය - පි. 270